# 16

# අපේ ගෙවත්තෙන්





**ගම්වැසියෝ තම ගෙවත්තේ බෝග වගා කරති. එය ඔවුන්ගේ ජීවනෝපාය ද විනෝදාංශය ද වෙයි. ඔවුන්ගේ දූ දරුවෝ පාසල් කාලයෙන් පසු වැඩිහිටියන්ට සහාය වෙති. හර්ෂ එළවළු වැවීමට පියාට උදව් කරයි. ඔහුගේ මිතුරා වන ශාන්ත ඊට සහභාගි වීම විනෝදාංශයක් ලෙස සලකයි.**

හර්ෂත්, ශාන්තත් එක ම පාසලේ ඉගෙන ගන්නා මිතුරෝ වෙති. ඔවුන්ගේ ගෙවල් පිහිටියේ ද එකිනෙකට ඉතා සමීප ව ය. හර්ෂගේ පියා දක්ෂ ගොවියෙකි. ඔහුට සාරවත් එළවළු කොටුවක් තිබේ. එහි ම හර්ෂගේ එළවළු පාත්ති ද වෙයි. හර්ෂ නිවාඩු දිනවල තම මිතුරා සමඟ වගාවේ වල් පැළෑටි ඉගිලීමත්, වගාවට සාත්තු කිරීමත් සිදු කරයි. එවැනි ඇතැම් දිනවල හර්ෂගේ මව ද වැඩට එක්වෙයි.

"අර! බලන්න ශාන්ත, කරවිල වැල්වල කහපාට මල් පිපුණා ම ලස්සන. හරියට මල් යායක් වගේ."

"ඇයි අර වැටකොළු වැල් වුණත් ඒ වගේ නේ," ශාන්ත කීවේ ය.

ඔවුහු එළවළු කොටුව පුරා ඇවිද්දෝ ය. තක්කාලි ගස් රතුපාට බෝල වැනි ගෙඩිවලින් බර වී බිමට පහත් වී තිබේ. හර්ෂත් ශාන්තත් ඒවාට මැසි බැඳීමට සූදානම් වෙති. වට්ටක්කා වැල් දිවූ හැමතැන ම ගෙඩිවලින් බර ව තිබේ. පලතුරු ඉදී සුවඳ විහිදෙයි. ගිරා මලිති පක්ෂීහු ඒ වටා පියාඹති. වඳුරු රංචු එළවළු කොටුවට පැමිණීමට නො හැකි ව බලා සිටිති.

"තාත්තෙ, මේ බලන්න ඊයේ ඉත්තෑවො ඇවිත් කොමඩු ගෙඩි කාලා."

"ඇත්ත ද? අපි මේවා ආරක්ෂා කරගන්න වැඩ පිළිවෙළක් යොදන්න ඕනෑ," යි පියා කීවේ ය.



"ඊයේ වැටුණු වැහි පොද හින්ද සාරණයි, ගොටු කොළයි දළු දමලා. මම මේ නිවිති කපලා මිටි බඳින්නම්," අම්මා කීවා ය.

"බලන්න වත්තෙ ගස්වලින් වැටෙන කොළ ටිකයි, ගෙදරින් ඉවත දමන කුණුකසළ ටිකයි, ගොම ටිකයි නිසා අපට හොඳ පොහොර ටිකක් හදාගන්න පුළුවන් වුණා. මේවා සාරවත් වුණේ ඒ නිසා. රසායනික පොහොර දැම්මා නම් කොයි තරම් මුදලක් වියදම් වෙනවා ද? අනික මේ වාගේ රසවත් අලුත් එළවළු ටිකකුයි, පලතුරු ටිකකුයි ගන්න ලැබෙනවා ද?" තාත්තා බෝග නෙළමින් කීවේ ය.

"ඒක ඇත්ත අපට මේවා හදා ගන්න ඒ තරම් මුදලක් වියදම් වුණේ නැහැ නේ" කියමින් අම්මා එළවළු කොටුව දෙස ආශාවෙන් බැලුවා ය.

"මම සියාතුට කිව්වා කරත්තය මෙහාට ම ගේන්න. මම යනවා එළවළු ටික ගෝනිවලට පුරවන්න. පුතාලා ඔය වල් පැළෑටි ටික උදුරලා පොහොර කොටුවට දමලා ඒ පැත්තට එන්න."

"හොඳයි තාත්තා"

ඔවුහු මුළු දවස පුරා වෙහෙසෙමින් එළවළු කොටුවේ වැඩෙහි යෙදුණෝ ය. පලදාව නෙළා පසු දින පොළට ගෙන යාම ඔවුන්ගේ එක ම ආශාව විය.



## ක්‍රියාකාරකම 01

පහත දැක්වෙන වචන පැහැදිලි ව ශබ්ද නගා කියවන්න.
பின்வரும் வசனங்களை தெளிவாக உச்சரித்து உரத்து வாசிக்கவும்.

| | |
|---|---|
| හර්ෂ | දක්ෂ |
| දුෂ්කර | භාෂාව |
| ආරක්ෂාව | ශිෂ්‍ය |
| විශේෂ | භාෂණය |
| පුෂ්ප | රක්ෂණය |
| භික්ෂුව | වාෂ්ප |

## ක්‍රියාකාරකම 02

පහත සඳහන් වාක්‍ය හා වාක්‍යවල හිස්තැනට ගැළපෙන වචන වරහනින් තෝරා ලියන්න.
பின்வரும் வாக்கியங்கள் மற்றும் வாக்கியப் பகுதிகளில் உள்ள இடைவெளிகளுக்குப் பொருத்தமான சொற்களை அடைப்பில் இருந்து தெரிந்து எழுதுக.

i. විභාගයෙන් ජය ලැබීම මගේ ............................ හේතුවක්.

ii. දිනූ .................. ජය ඝෝෂා පැවැත්වි ය.

iii. ඔහුගේ ........................ වෙළෙඳාමයි.

iv. සෙබළු මගීන්ට ........................ ලබා දුන්හ.

v. වාහන .......................... කිරීම අත්‍යවශ්‍යයි.

vi. ගුරුවරුන්ට ............................ පාඨමාලාවක් ලෙස පරිගණක විද්‍යාව ඉගැන්වේ.

vii. ........................ ආහාර සොයා පියාඹති.

viii. ඉගෙනීමේ දී .......................... පාවිච්චි කිරීම ප්‍රයෝජනවත් ය.

| | | | |
|---|---|---|---|
| විශේෂ | සන්තෝෂයට | ශබ්දකෝෂ | පක්ෂීහු |
| රක්ෂණය | ආරක්ෂාව | රක්ෂාව | පක්ෂය |

## ක්‍රියාකාරකම 03

i. පහත දැක්වෙන ඡේදය කියවා ශ,ෂ,ස යන අකුරු යෙදී ඇති වචන තෝරා ලියන්න.

பின்வரும் பந்தியை வாசித்து ශ,ෂ,ස இல் உள்ள சொற்களைத் தெரிந்து எழுதுக.

සහරාව අප්‍රිකාවේ පිහිටි මහා කාන්තාරයකි. එයට වර්ෂාව ලැබෙන්නේ කලාතුරකිනි. දහවලට එහි තද උෂ්ණත්වයක් පවතී. නමුත් රාත්‍රිය අතිශයින් ම ශීතල ය. එහි බිම විෂම ය. ඇතැම් තැනක කඳු හා උස් බිම් ඇත. වැල්ලෙන් වැසී ඇත්තේ සුළු කොටසකි. එහි මැද සාරවත් ප්‍රදේශ ද ඇත. රට ඉඳි ගස මේ ක්ෂේමභූමිවල සරු ලෙස වැඩේ.

## ක්‍රියාකාරකම 04

පහත සඳහන් එක් එක් වාක්‍යයේ හිස්තැනට ගැළපෙන නිවැරදි වචන ඉදිරියේ ඇති වරහන් තුළින් තෝරා සම්පූර්ණ කරන්න.

பின்வரும் வாக்கியங்களில் உள்ள இடைவெளிகளுக்குப் பொருத்தமான சொற்களை அடைப்பில் இருந்து எடுத்து நிரப்புக.

i. ඔහු ප්‍රශ්න පත්‍රයට .................. ලිව්වේ ය. (පිළිතුරු/පිලිතුරු)
ii. අපි .................... බැලීමට ගියෙමු. (ප්‍රදර්ශනය/ප්‍රදර්ෂනය)
iii. ගුරුතුමිය ................ ලෙස මට කතා කළා ය. (කාරුණික/කාරුනික)
iv. ඔහුට මහජන බැංකුවේ ...................... තිබේ. (ගිණුමක්/ගිනුමක්)
v. ...................... විෂය සමත්වීම අනිවාර්ය ය. (ගණිතය/ගනිතය)
vi. ඇයගේ චිත්‍ර ......................... තෑගි ලැබුණි. (නිර්මානයට/නිර්මාණයට)
vii. ........................ අසල කඩ වීදි තිබේ. (පුරහල/පුරහළ)
viii. සභාපතිතුමා උත්සව සභාවේ සියලු දෙනා ම.......... (පිළිගත්තේ ය/පිලිගත්තේ ය.)
ix. ඔහු සංගීතයෙහි ......................... වෙයි. (නිපුණයෙක්/නිපුනයෙක්)
x. කඳුකර ........................ තේ ගස සරුවට වැවේ. (පලාතේ/පළාතේ)

## ක්‍රියාකාරකම 05

පහත දැක්වෙන ආකාරයේ වගුවක් ඔබේ අභ්‍යාස පොතෙහි ඇඳ පාඩමේ සඳහන් වචන තෝරා අදාළ වගුවේ ලියන්න.
பாடத்தில் வந்துள்ள சொற்களைத் தெரிந்து பொருத்தமான கூட்டினுள் எழுதுக.

| | මූර්ධජ | | | දන්තජ | | තාලුජ |
|---|---|---|---|---|---|---|
| | ළ | ෂ | ණ | න | ල | ශ |
| උදා | පැළැටි | දක්ෂ | පැමිණීම | ඉගෙන | ගෙවල් | ශාන්ත |